WORKED.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,724—1959 අප්‍රේල් 13 වැනි සඳුදා—13.4.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදි)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1959 අංක 147**

අ.ආ.කා. අංකය : C 162/49 (III)

ප්‍රවාහණ හා රජයේ වැඩ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ඇම්. ඇෆ්. ද ඇස්. ජයරත්න මහතා දිවයිනට පෙරලා පැමිණෙන තුරු, 1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 51 (1) වැනි වගන්තිය යටතේ, වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ඇල්. ඇස්. බී. පෙරේරා මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1959 අප්‍රේල් මස 11 වැනි දින සිට , ප්‍රවාහණ හා රජයේ වැඩ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තනතුරෙහි වැඩ බැලීමට, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, පත්කළබව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 අප්‍රේල් 10 වැනි දින,
නුවර එළිය, අග්‍රාණ්ඩුකාරතුමාගේ කායර්‍යාලය.

---

## ආණ්ඩුවේ නිවේදන

**1950 අංක 25 දරණ ආහාර පාලන පනත**

**අංක 118 දරණ නියෝගය**

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) (i) වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව කෘෂිකර්ම හා ආහාර ඇමති තැන්පත් දොන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවලින් හෝ එම දිස්ත්‍රික්කවලට ආහාර පාලක තැන විසින් හෝ ඒ ඒ දිස්ත්‍රික්කවල නියෝජ්‍ය ආහාර පාලක විසින් හෝ උප ආහාර පාලක තැන විසින් හෝ ඔවුන් වෙනුවෙන් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් නැතිව කිසිම වී වර්ගයක කුමන ප්‍රමාණයක්වත් රථවාහන වලින් ගෙනයෑම හෝ ඉවත් කිරීම මෙම නියෝගයෙන් තහනම් කරමි.

මෙම නියෝගය සඳහා “ දිස්ත්‍රික්කය ” යනුවෙන් හැඟවෙන්නේ ආණ්ඩුවේ ඒජන්ත තැනගේ ආදයම් ප්‍රදේශය යි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

1959 අප්‍රේල් 11 වෙනිදා,
කොළඹ දීය.

---

**1950 අංක 25 දරණ ආහාර පාලන පනත**

**අංක 120 දරණ නියෝගය**

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) (v) දරණ වගන්තියෙන් මට පැවරී තිබෙන බලතල අනුව කෘෂිකර්ම හා ආහාර ඇමති තැන්පත් දොන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, මේ නියෝගයෙන් මෙහි පෙනෙන උප ලේඛනයේ සඳහන් ධාන්‍යාගාරයේ පාලනය භාර ගතිමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

1959 අප්‍රේල් මස 11 වෙනි දින,
කොළඹ දීය.

උපලේඛනය

චාමර්ස් ධාන්‍යාගාරය, කොළඹ

1041—ජේ. ඇන්. ආර් 1295—4,900 (4/59)

## 1950 අංක 25 දරණ ආහාර පාලන පනත

### අංක 121 දරණ නියෝගය

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) (vi) දරණ වගන්තියෙන් මට පැවරී තිබෙන බලතල අනුව, මෙදින සිට ලංකාවේ සෑම කොටසකම වෙළෙඳුන්ට සහ බෙදාහරින්නන්ට වී, වෙනත් ධාන්‍ය වර්ග හෝ එවැනි ධාන්‍ය වර්ග වලින් නැතහොත් එම ධාන්‍ය වර්ග මූලිකව අන්තර්ගතව සකස් කළ දෑ කොටස් කර දීමට විධිවිධාන සැළසීමට හා එම ද්‍රව්‍ය සලාක ක්‍රමයක් සංවිධාන කොට පරිපාලනය කිරීමට කෘෂිකර්ම හා ආහාර ඇමති තැන්පත් දොන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, ආහාර පාලක තැනට මේ නියෝගයෙන් නියම කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

1959 අප්‍රේල් මස 11 වැනි දින,
කොළඹ දීය.

---

## 1950 අංක 25 දරණ ආහාර පාලන පනත

### අංක 119 දරණ නියෝගය

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) (iv) දරණ වගන්තියෙන් මට පැවරී තිබෙන බලතල අනුව, මෙහි පෙනෙන උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් වරායවල හෝ ස්ථානවල රේගුවෙන් හාල්, වී, තිරිඟු, තිරිඟුපිටි හෝ කුරක්කන්, එම උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් පුද්ගලයාගෙන් හෝ (කාරණයට අදාල පරිදි) පුද්ගලයන්ගෙන් අයෙකුගෙන් ලබාගත් බලපත්‍රයක් යටතේ හා එම පුද්ගලයා විසින් කරනු ලබන ගෙන යා යුතු කාලය, ආකාරය හා ස්ථානය පිළිබඳව නියෝගය යටතේත් මිස ගෙන යෑම කෘෂිකර්ම හා ආහාර ඇමති තැන්පත් දොන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, මෙම නියෝගයෙන් තහනම් කරමි.

ඩී. පී. ආර් ගුණවර්ධන,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

1959 අප්‍රේල් මස 11 දින,
කොළඹ දීය.

### උපලේඛනය

| 1 වෙනි තීරය<br>වරාය හෝ ස්ථානය | 2 වැනි තීරය<br>බලපත්‍ර නිකුත් කළ හැකි අය |
|---|---|
| කොළඹ ... ... ... | ආහාර පාලක තැන |
| ගාල්ල ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, ගාල්ල ; නියෝජ්‍ය ආහාර පාලක තැන, ගාලු දිස්ත්‍රික්කය |
| යාපනය, කන්කසන්තුරෙයි, කයිට්ස්, පේදුරුතුඩුව, වල්වෙඩ්ඩිතුරෙයි | ආණ්ඩුවේ ඒජන්ත, යාපනය ; නියෝජ්‍ය ආහාර පාලක තැන, යාපනේ දිස්ත්‍රික්කය |
| ත්‍රිකුණාමලය ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, ත්‍රිකුණාමලය ; නියෝජ්‍ය ආහාර පාලක තැන, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය |
| තලෙයිමන්නාරම, මන්නාරම ... ... | ආණ්ඩුවේ ඒජන්ත, මන්නාරම ; නියෝජ්‍ය ආහාර පාලක තැන, මන්නාරම් දිස්ත්‍රික්කය |
| මඩකලපුව ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, මඩකලපුව ; නියෝජ්‍ය ආහාර පාලක තැන, මඩකලපු දිස්ත්‍රික්කය |
| බේරුවල, කළුතර ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, කළුතර ; නියෝජ්‍ය ආහාර පාලක තැන, කළුතර දිස්ත්‍රික්කය |
| මුලතිව් ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, වව්නියා ; නියෝජ්‍ය ආහාර පාලක තැන, වව්නියා දිස්ත්‍රික්කය |
| පුත්තලම, කල්පිටිය ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, පුත්තලම ; නියෝජ්‍ය ආහාර පාලක තැන, පුත්තලම් දිස්ත්‍රික්කය |
| මීගමුව ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, කොළඹ ; නියෝජ්‍ය ආහාර පාලක තැන, කොළඹ දිස්ත්‍රික්කය |

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.